# අධ්‍යාපන අමාත්‍යාංශය

## ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය ස්ථාපිත කිරීම

## පුරප්පාඩු (කොන්ත්‍රාත් පදනම මත)

මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2019.03.15 දිනැති හා අංක 1/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාර, පහත සඳහන් තනතුරු සඳහා යෝග්‍ය පරිදි සුදුසුකම්ලත්, කාර්යශූර ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. ප්‍රමාණ සමීක්ෂක (PS4 කාණ්ඩය A) - තනතුරු 01

**සුදුසුකම් :** (පහත i හෝ ii හෝ iii)

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධියක්

හෝ

ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්

හෝ

ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ පිළිගත් වෘත්තීය අධ්‍යාපන ආයතනයකින් ලබාගත්, සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක්

හෝ

ප්‍රමාණ සමීක්ෂණයට අදාළ තනතුරක් සඳහා, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය කුසලතා (NVQ 7) 7 වන මට්ටමට නොඅඩු, ප්‍රවීණතා සහතිකයක් ලබා සිටීම.

සහ

උපාධියෙන් පසු ප්‍රමාණ සමීක්ෂණ තනතුරක අවම තරමින් වසර 05 ක පළපුරුද්ද.

ii. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුර සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ 6) 6 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා සිටීම.

සහ

ප්‍රමාණ සමීක්ෂණය ක්ෂේත්‍රයේ, අවම තරමින් වසර 11 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

iii. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය කුසලතා (NVQ 5) 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ක්ෂේත්‍රයේ අවම තරමින් වසර 16 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

**වැටුප :** PS4 මට්ටම – රු. 90,000/-

### 02. තාක්ෂණික නිලධාරී - සිවිල් (PS 6 - කාණ්ඩය A) - තනතුරු 01 යි

**සුදුසුකම් :** (පහත i හෝ ii හෝ iii)

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

හෝ

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන සුදුසුකමක්.

හෝ

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත්, ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන වෘත්තීයවේදී සුදුසුකමක්

හෝ

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය කුසලතා (NVQ 7) 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

ii. සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ 6) 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා සිටීම

සහ

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම තරමින් වසර 05 ක පළපුරුද්ද.

iii. සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ තනතුරක් සඳහා, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය කුසලතා (NVQ 5) 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම තරමින් වසර 10 ක පළපුරුද්ද.

**වැටුප :** PS6 මට්ටම – රු. 55,000/-

**වයස :** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 64 ට අඩු විය යුතුය.

**ඉහත තනතුරු සඳහා අවශ්‍ය ප්‍රවීණතා / නිපුණතා**

i. ඉංග්‍රීසි භාෂාවෙන් වාර්තා ලිවීම පිළිබඳ දක්ෂතා සහ අනර්ඝ, අන්තර් පුද්ගල සන්නිවේදන කුසලතා (වාචික හා ලිඛිත)

i. Auto CAD සහ MS Project පිළිබඳ නිපුණතාව හෝ සමාන දක්ෂතා

iii. MS Office Packages පිළිබඳ මනා දැනුම සහිත, පරිගණක සාක්ෂරතාව.

iv ස්වාධීනව හා කණ්ඩායම් වශයෙන් වැඩකිරීමට සහ බහුවිධ කාර්ය කටයුතු කළමනාකරණය කර ගැනීමට ඇති හැකියාව.

ඉංග්‍රීසි භාෂාවෙන් වාර්තා ලිවීම පිළිබඳ කුසලතා, විදේශීය අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිවල පෙර පළපුරුද්ද, ඉදිකිරීම් පිළිබඳ පාලන නීති රීති හා සේවා කොන්දේසි හා නියමයන් පිළිබඳ අර්ථ දැක්වීමේ නිපුණතාවන් හා ප්‍රවීණතාවන් විශේෂ සුදුසුකම් සේ සලකනු ලැබේ.

**සේවා නියමයන් හෝ කොන්දේසි**

බඳවා ගැනීම්, එක් වසරක කාල සීමාවකට පූර්ණකාලීන, කොන්ත්‍රාත් පදනම මත වන අතර, සතුටුදායක කාර්ය සාධනය මත වාර්ෂිකව නැවත අලුත්කරවා ගත හැකිවනු ඇත. සේවා (රැකියා) ස්ථානය "ඉසුරුපාය" හෝ නාරන්ගල්ලහි ඉදිකිරීම් වැඩබිම හි වනු ඇත.

**අයදුම්පත් :**

අයදුම්පත්, අයදුම්කරුවන්ගේ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු ප්‍රකාශ (CV) සමග අයදුම්කරුවන්ගේ අධ්‍යාපනික, වෘත්තීයවේදී සුදුසුකම් හා පළපුරුද්ද, හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විමසුම් විස්තර (ජංගම සහ ඊමේල්) හා නම් හා ලිපිනයද සමගම, අයදුම්කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ, පැහැදිලි සටහන් කර 2022 මැයි මස 06 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සහතිකපත්‍රවල පිටපත්, අයදුම්පතට අමුණා එවිය යුතුය.

රාජ්‍ය අංශයේ / අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන්, ස්වකීය අයදුම්පත්, සිය අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන්, යොමු කළ යුතුය.

කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

**අතිරේක ලේකම් (ඉංජිනේරු) / ව්‍යාපෘති අධ්‍යක්ෂක,**
**අධ්‍යාපන අමාත්‍යාංශය,**
**බිම් මහල, "ඉසුරුපාය",**
**බත්තරමුල්ල.**